# කතිරයේ බලය

புள்ளடியின் பலம்

ISSN-2706-0047

වෙළුම 5 කලාපය 3 මැතිවරණ කොමිෂන් සභාව සැප්තැම්බර්-දෙසැම්බර් 2021




# අටළොස් විය සම්පූර්ණ වූ විගසම

## තරුණ ප්‍රජාවට ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිය ලබා දීම.


**චින්තක කුලරත්න**

අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති, විමර්ශන හා සැලසුම්)


1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත අනුව ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි කරනු ලබන්නේ එක් එක් වර්ෂයේ ජුනි මස පළමු දිනට වයස අවුරුදු දහඅට (18) සම්පූර්ණ කළ තැනැත්තන් ය. එහිදී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 ව්‍යවස්ථාවේ සඳහන් නුසුදුසුකමකට යටත් නොවිය යුතු අතර, යම් මැතිවරණ කොට්ඨාසයක නාමලේඛනයක යම් තැනැත්තකුගේ නම ඇතුළත් කර ගනු ලැබීම සඳහා ලියාපදිංචිය සිදු කරනු ලබන වර්ෂයේ ජුනි මස පළමු දිනට එනම් සුදුසුකම් ලැබීමේ දිනයට එම කොට්ඨාසයේ "සාමාන්‍ය පදිංචිය" තිබිය යුතු යැයි දක්වා ඇත. මෙම සාමාන්‍ය පදිංචිය තිබෙන ලිපිනය යන්න "සුදුසුකම් ලැබීමේ ලිපිනය" ලෙස ද සලකනු ලබයි. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සෑම වසරකම සිදු කරනු ලබන අතර, යම් ඡන්ද විමසීමක දී එම ඡන්ද විමසීමේ නිවේදනය නිකුත් කරනු ලැබූ අවස්ථාවේ සහතික කරනු ලැබ තිබූ ඡන්දහිමි නාමලේඛනයෙහි සඳහන් තැනැත්තන්ට පමණක් ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම ලැබේ. මෙම විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 88 වන ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ "උචිත ඡන්දහිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කර ඇත්නම් මිස ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලැබිය යුත්තේ ය" යනුවෙනි. මෙහි උචිත ඡන්දහිමි නාමලේඛනය යනුවෙන් දක්වා ඇත්තේ අදාළ ඡන්ද විමසීම නිවේදනය කරන අවස්ථාවේ සහතික කරනු ලැබ තිබූ ඡන්දහිමි නාමලේඛනයයි.

පනතේ දැක්වෙන ඉහත ප්‍රතිපාදන අනුව, යම් වර්ෂයක ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ දී ජුනි මස පළමු දිනට පසුව වයස අවුරුදු දහඅට (18) සම්පූර්ණ කළ තැනැත්තන්ට ඊළඟ වර්ෂයේ මැයි 31 දිනට පෙර යම් ඡන්ද විමසීමක් පැවැත් වුවහොත් ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම නොලැබේ. මෙම හේතුව මත වයස අවුරුදු දහනවය (19) හෝ විස්ස (20) ද සම්පූර්ණ වීමෙන් ද පසුව ඡන්දය ප්‍රකාශ කිරීමට අවකාශය හිමිනොවන අවස්ථා ඇත. මේ තත්ත්වය ඇතිවනුයේ අවුරුදු දහඅට (18) සම්පූර්ණ වන තැනැත්තන් නියමිත දිනට (ජුනි මස පළමු දින) සුදුසුකම් ලැබුව ද ඔවුන්ට ස්වකීය ඡන්දය ලියාපදිංචි කිරීමට ඊළඟ වර්ෂයේ ජුනි මස 01 දින තෙක් සිටීමට සිදුවන නිසාවෙනි.

විශේෂයෙන්ම දැනට පවත්නා ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රමවේදය අනුව යම් වර්ෂයක දී පැවැත්වෙන ඡන්ද විමසීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබෙනුයේ ඡන්දහිමි නාමලේඛනය වලංගු වන වර්ෂයේ මැයි මස 31 දිනට වයස අවුරුදු දහඅට (18) සම්පූර්ණ වූ තැනැත්තන්ට පමණි. මේ හේතුවෙන් ඡන්ද හිමියන් ගණන් ගන්නා දිනයට පසුව ඊළඟ වර්ෂයේ ජුනි 01 දින දක්වා අතරතුර කාලයේ දී පැවැත්වෙන ඡන්ද විමසීමක දී වයස අවුරුදු දහඅට (18) සම්පූර්ණ වූ තැනැත්තන් හට ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව අහිමි වේ.

වයස අවුරුදු දහඅට (18) ට වැඩි පුරවැසියන්ට හිමිවිය යුතු ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීමේ අයිතිය නියමිත දිනයේ දී ම ලබා දීමට ක්‍රියා කරන ලෙස තරුණ කණ්ඩායම් විසින් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින් ද මැතිවරණ කොමිෂන් සභාව වෙත වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි. තව ද මේ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ඉල්ලා මෑතක දී දිවයිනේ විවිධ ප්‍රදේශවල තරුණයින් දෙලක්ෂයකට අධික පිරිසක් විසින් ජාතික තරුණ සේවා සභාව හරහා අත්සන් කරනු ලැබූ පෙත්සමක් මැතිවරණ කොමිෂන් සභාව මඟින් ජනාධිපතිතුමා සහ අග්‍රාමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර ඇත. එමෙන්ම වයස අවුරුදු දහඅට (18) ඉක්මවූ තරුණයින්ට ඡන්ද බලය අහිමිවීම සම්බන්ධයෙන් ඉහත කරුණු කාරණාවලට අමතරව තරුණ සංවිධානයක් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ද පැමිණිලි කර තිබුණි. ඒ පිළිබඳව සාකච්ඡා කිරීමේ දී යොවුන් පුරවැසියන් උපරිම සංඛ්‍යාවකට ඡන්ද බලය හිමිවන පරිදි නීති සැකසීමේ අවශ්‍යතාව ද අවධාරණය කරනු ලැබිණ. එසේම මේ පිළිබඳව දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින් ද මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කොට තිබුණි. එබැවින් මෙම යෝජනාව ප්‍රතිපත්තිමය වශයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබීය. ඒ සඳහා වූ නීති සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 උපාය මාර්ග සැලැස්මට ඇතුළත් කර තිබුණ ද එම කාලය තුළ දී ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වුයෙන් එය යථාර්තයක් බවට පත් කරන ලද්දේ වර්තමාන මැතිවරණ කොමිෂන් සභාව විසිනි.

ඡන්දහිමි නාමලේඛනය වාර්ෂිකව සහතික කිරීමට අමතරව මාස හතරකට වරක් අටළොස්විය සම්පූර්ණ කරනු ලබන

තැනැත්තන්ගේ නම් ඇතුළත් පරිපූරක ලැයිස්තු සැකසීමටත් එම ක්‍රියාදාමය අඛණ්ඩව සිදු කරමින් ඡන්ද විමසීමකට පෙර සහතික කරන ලද උචිත ඡන්දහිමි නාමලේඛනයට අමතරව හා එහි කොටසක් ලෙස මෙම පරිපූරක ලැයිස්තුව සැළකීමට හැකි වනසේ 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට සංශෝධන ඉදිරිපත් කරමින් අවස්ථාව සළසා ඇත.

1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ මූලික සංශෝධනය වනුයේ එකී පනතේ "සුදුසුකම් ලැබීමේ" දිනය ලෙස සඳහන් වන "යම් වර්ෂයක ජුනි මස පළමු දින" වෙනුවට "පෙබරවාරි මස පළමු දින" ඒ සඳහා නියම කරනු ලැබීමයි. වාර්ෂික අය වැය මත සිදු කෙරෙන ප්‍රාදේශීය සංවර්ධන කාර්යයන්ට අදාළ මූලික ඇස්තමේන්තු සැකසීම වසරෙහි මුල් කාර්තුවේ දී සිදු වන අතර, එම සංවර්ධන ව්‍යාපෘති බොහෝ විට ක්‍රියාත්මක වීම සිදු වනු ලබන්නේ වසරේ දෙවන, තුන්වන කාර්තුවල ය. එබැවින් එම ව්‍යාපෘතිවලට අදාළ නිරීක්ෂණ, ප්‍රගති වාර්තා ලබාදීම් හා ස්ථානීය පරීක්ෂණ වැනි ක්ෂේත්‍ර කාර්යයන් හේතුවෙන් මෙම කාලය ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ දී ගණන් ගන්නා නිලධාරීවරු ලෙස කටයුතු කරන ග්‍රාම නිලධාරීන් හට රාජකාරි බහුල කාලයක් වේ. එමෙන්ම බොහෝ විට දෙවෙනි කාර්තුවේ සිට වර්ෂ අවසානය දක්වා සෑම මාසයකම විවිධාකාර වූ උත්සව සහ සැමරුම් සංවිධානය කිරීමට ග්‍රාම නිලධාරීන් හට සිදු වේ. මෙම සියලූ කරුණු සලකා බලා ක්ෂේත්‍රයේ රාජකාරි අවම වන පළමු කාර්තුවේ පෙබරවාරි මස පළමු දින සුදුසුකම්ලත් දිනය ලෙස නියම කරනු ලැබීම පිණිස අදාළ සංශෝධන මේ යටතේ ඉදිරිපත් කර ඇත.

මේ අනුව පරිපූරක ලැයිස්තු සකස් කරනු ලබන කාල වකවානු,

- **යම් වර්ෂයක පෙබරවාරි මස පළමු දින සිට මැයි මස 31 (.02.01 සිට .05.31)**
- **එම වර්ෂයේ ජුනි මස පළමු වන දින සිට සැප්තැම්බර් මස 30 (.06.01 සිට .09.30)**
- **ඔක්තෝම්බර් මස පළමු දින සිට එළඹෙන වර්ෂයේ ජනවාරි මස 31 (.10.01 සිට .01.31) වේ**

කාලසීමාවට අදාළ වූ පරිපූරක ලැයිස්තුව, ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරයා විසින් සති දෙකක් තුළ ගැසට් නිවේදනයක් මඟින් හා සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවලින් පළවන එක් ප්‍රවෘත්ති පත්‍රයක හෝ ප්‍රකාශයට පත් කරමින් එම නිවේදනයේ අදාළ පරිපූරක ලැයිස්තුවල පිටපත් ලියාපදිංචි කිරීමේ නිලධාරි කාර්යාලයේ දී හෝ නිශ්චිතව සඳහන් කරනු ලබන එම මැතිවරණ කොට්ඨාසයේ වෙනත් ස්ථානයක දී හෝ යුක්ති සහගත වේලාවක් තුළ පරීක්ෂා කිරීමට හැකියාව පවතින බව ද දැනුම් දිය යුතු ය. එම දැන්වීමේ දින සිට දින දහයක් තුළ තමාගේ නම ඇතුළත් කරවා ගැනීමට අයිතිය ඇති බව කියා සිටින තැනැත්තන්ට ලියාපදිංචි කිරීමේ නිලධාරියා වෙත ඉල්ලීමක් කළ හැකිය.

එසේම පරිපූරක නාමලේඛනයේ ඇතුළත් වූ නමකට විරෝධය පෑමක් වෙත්නම් එකී විරෝධය පෑම ද නිවේදනයේ දින සිට දින දහයක් තුළ ලියාපදිංචි කිරීම් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුවේ. මෙම හිමිකම් පෑම් හා විරෝධය පෑම් සම්බන්ධව ක්‍රියා කළ යුතු පටිපාටිය පිළිබඳව 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14(6) සිට 14(16) දක්වා හා 15 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ කර ගත යුතු ය.

එම හිමිකම් පෑම් හා විරෝධය පෑම් නිශ්චය කරනු ලැබීමෙන් ඉක්බිතිව එම පරිපූරක ලැයිස්තුව, ලියාපදිංචි කිරීමේ නිලධාරියා විසින් සහතික කළ යුතු වේ. සහතික කළ පරිපූරක ලේඛනය ඡන්දහිමි නාමලේඛනයට ඇමුණුමක් ලෙස ඇතුළත් කළ යුතු ය. මේ අනුව ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත් කරන අවස්ථාවේ සහතික කරන ලද පරිපූරක ලැයිස්තු උචිත ඡන්දහිමි නාමලේඛනයේ කොටසක් ලෙස සලකනු ලබන නිසා අටළොස්විය සම්පූර්ණ වූ තැනැත්තන්ට, අටළොස්විය සම්පූර්ණ වී මාස හතරක කාලයක් තුළ ඡන්දහිමි නාමලේඛනයට ස්වකීය නම ඇතුළත් කර ගැනීමේ අවස්ථාව හිමි වේ.

විශේෂයෙන් සඳහන් කළ යුතු කාරුණු වනුයේ පනතේ මෙම සංශෝධනය අනුව පරිපූරක ලැයිස්තු සඳහා නම් ඇතුළත් කිරීමට ඉල්ලීම් කරනු ලැබිය හැකි වනුයේ එම කාලය තුළ අටළොස්විය සම්පූර්ණ කළ තැනැත්තන්ට පමණක් වන අතර වෙනත් යම් හේතුවක් නිසා ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනයට නම ඇතුළත් නොවූ තැනැත්තන්ට නම ඇතුළත් කර ගැනීම සඳහා මෙම සංශෝධනය යටතේ අවස්ථාව හිමි නොවීමය.

## සමාලෝචනය

ඡන්දහිමියෙකු වශයෙන් ලියාපදිංචි වීමට තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කරමින් සහ ඒ සඳහා අවස්ථා පුළුල් කරමින් නිසි වයස සම්පූර්ණ වූ වහාම ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමටත් එසේ ලියාපදිංචි වූ ඡන්ද හිමියන්ට ලියාපදිංචියෙන් පසු පැවැත්වෙන පළමු ඡන්ද විමසීමේ දී ම සිය ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව සලසා දීමත් සඳහා පියවර ගත යුතු බවට වූ මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිය මෙම සංශෝධිත පනත සම්මත වීමෙන් සාක්ෂාත් විය. ඒ අනුව වාර්ෂිකව සිදු කෙරෙන ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීම හා සුදුසුකම් ලත් පුරවැසියන් ඇතුළත් මැතිවරණ ක්‍රියාවලියක් යටතේ වයස අවුරුදු දහඅට (18) සම්පූර්ණ වන යෞවනයන්ට ඡන්දය භාවිතා කළ හැකි වනසේ පරිපූරක ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීම සඳහා නීති සැකසීමට 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත මගින් විධිවිධාන සලසා ඇති අතර, එම සංශෝධිත පනත 2022.02.01 දින සිට බලාත්මක වේ. මෙය ප්‍රජාතන්ත්‍රවාදය අගයන බොහෝ පාර්ශ්වවල මහත් පැසසුමට ලක් වී ඇති බව සඳහන් කළ යුතුව ඇත. තරුණ ප්‍රජාව ඡන්ද විමසීම් ක්‍රියාවලියෙන් ඉවත්ව සිටීම අවම කර ගැනීම අත්‍යවශ්‍යව පවතින අතර, ඒ සඳහා අදාළ සියලු සංවිධාන විසින් අවධානය යොමු කර සුදුසු පියවර ගැනීම කළ යුතුව පවතින බව ද සඳහන් කළ යුතු ය.

# මැතිවරණ නීති සංශෝධනයට පත් කරන ලද

## පාර්ලිමේන්තු තේරීම්කාරක සභාව වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

දැනට පවත්නා මැතිවරණ නීති වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමේ අවශ්‍යතාව දීර්ඝ කාලයක් තිස්සේ පාර්ශ්වකරුවන් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. ඒ පිළිබඳව අවධානය යොමු කළ මැතිවරණ කොමිෂන් සභාව විසින් අදාළ නීති සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ පැවති සාකච්ඡාවේ දී දැනුම්වත් කරන ලද අතර ඊට ප්‍රතිචාර වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් මැතිවරණ නීති සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවක් පත් කිරීමට කටයුතු කර ඇත. එම තේරීම් කාරක සභාව සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවල සාරාංශයක් මතු දක්වා ඇත.

- **දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය**

ලංකාවේ ලියාපදිංචි ඡන්ද දායක සංඛ්‍යාව හා සංසන්දනාත්මකව බලන කළ දැනට ලියාපදිංචි දේශපාලන පක්ෂ සංඛ්‍යාව ඉතා ඉහළ අගයක් ගෙන තිබෙන අතර එය මැතිවරණ කළමනාකරණය සංකීර්ණ තත්ත්වයකට යොමුකර ඇති හෙයින් මෙම දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය සලකා බලා සුදුසු සංශෝධන සිදු කිරීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා පහත දැක්වෙන ප්‍රධාන කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත.

- දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම හා පිළිගැනීමේ ක්‍රමවේදය ප්‍රාදේශිය දේශපාලන පක්ෂ, ලියාපදිංචි දේශපාලන පක්ෂ හා පිළිගත් දේශපාලන පක්ෂ වශයෙන් වර්ගීකරණය කිරීම.
- මහජන නියෝජිතයන් ලෙස තේරී පත්වීම මත දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම.
- දේශපාලන පක්ෂ ව්‍යවස්ථා වලට ප්‍රජාතන්ත්‍රීය ගුණාංග ඇතුළත් කිරීම.
- දේශපාලන පක්ෂ සන්ධාන ගත වීම හා සන්ධාන පක්ෂයක් ලෙස පිළිගැනීම පිළිබඳව සමාලෝචනය කිරීම.
- දේශපාලන පක්ෂ කිහිපයකින් සැදුම්ලත් සන්ධානයක බලාත්මක කාලය පිළිබඳව නීති හඳුන්වා දීම.
- සන්ධාන වශයෙන් තරග කිරීම හා අවබෝධතා ගිවිසුම් සම්බන්ධව.

- **ඡන්ද ක්‍රමයේ කළ යුතු සංශෝධන**

පාර්ලිමේන්තු හා පළාත් සභා ඡන්ද විමසීම් සඳහා දැනට පවත්නා සමානුපාතික නියෝජන හා මනාප ක්‍රමය පිළිබඳව ජනතා විශ්වාසය බොහෝ දුරට බිඳ වැටී තිබේ. එසේම පක්ෂ හා අපේක්ෂකයන් අතර ද ගැටුම් ඇති වන ඡන්ද ක්‍රමයක් හෙයින් විකල්ප ඡන්ද ක්‍රම හඳුන්වා දීම මැතිවරණ කොමිෂන් සභාවේ අපේක්ෂාව වේ. කේවල හා සමානුපාතික ප්‍රතිශතය ලෙස විවිධ නියෝජනයන්ට ඉඩ ලැබෙන සාධාරණ ප්‍රතිශතයක් සහිත මිශ්‍ර සමානුපාතික නියෝජන ක්‍රමය වඩා ප්‍රශස්ත මැතිවරණ ක්‍රමයක් ලෙස මැතිවරණ කොමිෂන් සභාව සලකනු ලැබේ.ප්‍රතිශතය 60% ක් හා 40% ක් ලෙස අනුපාතගත කිරීම යහපත් නියෝජනයකට මෙන්ම ගැටළු අවම කිරීමට ද හේතුවන බව මැතිවරණ කොමිෂන් සභාවේ අදහස වන අතර ද්විත්ව ඡන්ද පත්‍රිකා ක්‍රමය පිළිබඳව ද අදහස් ඉදිරිපත් කොට ඇත.

- **මැතිවරණ දින නියම කිරීමට හා අවශ්‍යතාව පරිදි කල් දැමීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට ලබා ගැනීම**

එකම පනතකින් ක්‍රියාත්මක වුව ද කඩින් කඩ මැතිවරණ/ ඡන්ද විමසීම් පැවැත්වීම වෙනුවට එක් නිශ්චිත දිනයක දී පැවැත්වීම හා සෑම මැතිවරණයකම/ ඡන්ද විමසීමකම දින නියම කිරීම් හා ප්‍රායෝගික තත්ත්වය මත අවශ්‍යතාව පරිදි කල් දැමීමේ බලය මැතිවරණ කොමිෂන් සභාව සතු විය යුතු බව

- **පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීම (Advance Voting and Special Poling Station)**

ජනමාධ්‍යවේදීන්, නිරීක්ෂණ සංවිධාන හා වෙනත් අත්‍යවශ්‍ය සේවාවන් සඳහා දැනට ක්‍රියාත්මක තැපෑලෙන් ඡන්දය දීමේ ක්‍රමය යටතේ පහසුකම හිමි රාජ්‍ය, ව්‍යවස්ථාපිත හා අත්‍යවශ්‍ය රැකියා ක්ෂේත්‍ර ප්‍රමාණය පුළුල් කිරීම හෝ පූර්ව ඡන්ද විමසීම් දිනයක් පැවැත්වීම හා ඡන්ද විමසීම් දිනයේ විශේෂ ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීමට යෝජනා කරනු ලබයි.

ඡන්ද පොළට පැමිණීමට නොහැකි හෝ පැමිණිය ද ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි ආබාධිත පිරිස් වෙනුවෙන් ජංගම ඡන්ද පොළවල් ඇති කොට නිවසටම මැතිවරණ නිලධාරීන් යවා ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව දීම හා "බ්‍රේල්" ක්‍රමය වැනි විකල්ප ක්‍රම භාවිතා කිරීම සඳහා නීති සම්පාදනය කිරීම.

- **විද්‍යුත් ඡන්ද සලකුණු ක්‍රමය හඳුන්වාදීමේ වැදගත්කම**

ඡන්ද පත්‍රිකා මගින් ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවට බොහෝ කළක සිට යෝජනා කරනු ලබන විද්‍යුත් ඡන්ද සලකුණු කිරීමේ යන්ත්‍ර (EVM) හඳුන්වාදීම.

- **පවත්නා ඇප මුදල් සංශෝධනය පිණිස වූ යෝජනා**

සියලුම මැතිවරණ/ ඡන්ද විමසීම් පනත්වල සඳහන් ඇප මුදල් තීරණය වී ඇත්තේ අදාළ පනත් පළමුවරට හඳුන්වා දී තිබෙන වර්ෂයේ මට්ටම හා සමපාත වෙමිනි. තරග කරනු ලබන පක්ෂ/ අපේක්ෂක සංඛ්‍යාව ඉහළ යාම අනුව මැතිවරණ කළමනාකරණයේ දී ඇතිවන ගැටළු අවම කිරීම සඳහා වර්තමානයට ගැලපෙන පරිදි ඇප මුදල් සංශෝධනය කිරීමට සලකා බැලීම.

- **ඇප තැන්පත් කිරීමේ කාලවකවානු සංශෝධනය කිරීම**

පරිපාලනමය හා ව්‍යවස්ථාපිත කරුණු මත මෙම කාර්යයන් වඩාත් පහසු කරවනු පිණිස ඇප මුදල් භාර ගැනීමේ දින වකවානු සංශෝධනය කිරීම.

- **නාමයෝජනා පරිපාටියට අදාළ දින වකවානු සංශෝධනය කිරීම**

පසුගිය අත්දැකීම් අනුව නාමයෝජනා භාර දීමේ දී 95% පමණ ප්‍රතිශතයක් වාර්තා වී ඇත්තේ අවසන් දින දෙකක

කාලය තුළ දීය. ඒ බැවින් ඒ සඳහා දැනට වෙන්කර තිබෙන දින ගණන දින තුනකට සීමා කිරීම හා හතරවන දිනයක් පනවා එදින තේරීම්භාර නිලධාරි තීරණ දැනුම් දීමට වෙන් කිරීම.

- **අපේක්ෂකයන්ගේ නුසුදුසුකම්**

අපේක්ෂකයන් නුසුදුසුකමකට යටත් නොවන බවට වූ දිවුරුමක් ලබා ගැනීමත් එයට අනුව ඔහු/ ඇය නුසුදුසුකමකට යටත් වේ නම් අදාළ තැනැත්තාගේ පමණක් නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම හා අසත්‍ය තොරතුරු ප්‍රකාශ කොට ධුර ලබා ඇත්නම් නිසි විමර්ශනයකින් අනතුරුව එම ධුරවලින් ඉවත් කිරීම.

- **තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීමේ දින වකවානු සංශෝධනය කිරීම**

පූර්ව අත්දැකීම් අනුව විවිධ අවස්ථානුගත කරුණු හේතුවෙන් තැපැල් ඡන්ද අයදුම්පත් භාරගැනීමේ දින වකවානු විටින් විට කල් දැමීම සිදු කොට ඇත. එබැවින් තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම නාමයෝජනා භාරගැනීම අවසන් වන දිනට පසු දින දක්වා සංශෝධනය කිරීම.

- **ඡන්ද දායකයා පරීක්ෂා කිරීම හා උචිත ලකුණු සලකුණු කිරීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම**

ඡායාරූපයක් සහිත හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය කර තිබෙන හෙයින් මෙම ක්‍රියාවලිය තවදුරටත් සිදු කිරීම ප්‍රයෝගික ද යන්න සලකා බැලීම.

- **නිල ඡන්ද දැන්වීම් පත් බෙදාහැරීම**

මේ සම්බන්ධයෙන් දැනට පවත්නා ක්‍රමවේදය සඳහා අධික වියදමක් හා මිනිස් ශ්‍රමය වැය වන බැවින් වඩාත් පහසු හා අවම වියදම් සහිත විකල්ප ක්‍රමවේද කෙරෙහි යොමු වීමේ වැදගත්කම.

- **ඡන්ද විමසීම අවසන් වන වේලාවේ දී පෝලිමේ සිටින සියලුදෙනාට ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව ලබා දීම සම්බන්ධ යෝජනාව**

විවිධ දුෂ්කරතා හේතුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නියමිත වේලාව අවසන් වීමට පෙර පෝලිමට එක්ව සිටින සියළුම තැනැත්තන්ට ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබාදීම.

- **මැතිවරණ ආරවුල් කළමනාකරණය හා නීති බලාත්මක කිරීමට අදාළ සංශෝධන**

නිදහස් සහ සාධාරණ ඡන්ද විමසීමක් සඳහා වන යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවට මැතිවරණ වැරදි සම්බන්ධ නඩු පැවරීමේ බලය ලබා දීම හා පොලිසිය වෙත දැනට පවත්නා නීතිය යටතේ තිබෙන බලතල තවදුරටත් පුළුල් කිරීම.

- **මැතිවරණ වියදම් පාලනයට නීති හඳුන්වාදීම**

පක්ෂ/ අපේක්ෂකයින් විසින් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා විශාල වශයෙන් මුදල් වැය කොට ප්‍රචාරක වාසිය මඟින් නියෝජිතයින් ලෙස තේරී පත් වීම වැළැක්වීම පිණිස මැතිවරණ කොමිෂන් සභාව විසින් දැනටමත් ඉදිරිපත් කරනු ලැබ ඇති, නීතිපතිවරයා විසින්ද එකඟතාවය පළ කර ඇති මැතිවරණ වියදම් පාලන පනත් කෙටුම්පත, පනතක් ලෙස සම්මත කිරීම හෝ අවම වශයෙන් වෙනත් විකල්ප වියදම් පාලන ක්‍රම හඳුන්වා දීම සඳහා නීති සංශෝධනය කිරීම අත්‍යවශ්‍යව පවතින බව.

- **කාන්තා හා තරුණ නියෝජනය ශක්තිමත් කිරීම**

රටේ පාලන බලයට හවුල් වීම සඳහා තරුණ හා කාන්තා නියෝජනය සඳහා නිශ්චිත ප්‍රතිශතයක් ලබා දීමට අවශ්‍ය නීති රීති හඳුන්වා දීම.

- **නිදහස් දේශපාලන ගුවන් ප්‍රචාර හා රූපවාහිනී ප්‍රචාර ලබා දීම**

ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ පනත්වල දැක්වෙන විධිවිධාන අනුව රාජ්‍ය මාධ්‍ය වෙත පමණක් ක්‍රියාත්මක වන මෙම නීතිය තුළින් එකී රාජ්‍ය ආයතනවල මූල්‍ය තත්වයට අහිතකර බලපෑම් ඇති කරනු ලබන හෙයින් එම නීති සුදුසු සංශෝධනයකට ලක් කිරීම.

- **මාධ්‍ය උපමාන බලාත්මක කිරීම**

නිදහස් සහ සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ජනමාධ්‍යයට ඇති බලපෑම සුළු පටු නොවේ. එබැවින් මාධ්‍ය නිදහසට බාධා ඇති නොවන පරිදි ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී මාධ්‍ය උපමාන බලාත්මක කිරීමට අවශ්‍ය නීති රීති හඳුන්වා දීම හා ඒවා බලාත්මක කිරීම.

- **මැතිවරණ කාලසීමාවේ ප්‍රචාරක කටයුතු**

මැතිවරණ කාලසීමාවේ දී මාධ්‍ය ආයතන විසින් පක්ෂ/ අපේක්ෂක ප්‍රචාරය සඳහා අය කරනු ලබන මුදල් අසීමාන්තිකව වැඩි කරන බවට මත පළ වී තිබේ. එබැවින් පවතින ප්‍රචාරක ක්‍රමවේද හා ඊට අදාළ නීති වර්තමානයට ගැළපෙන පරිදි සංශෝධනය කිරීම.

- **රාජ්‍ය සම්පත් අවභාවිතාව වැළැක්වීමට අදාළ යෝජනා**

යම් පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනයට හෝ අගතියට පත්වන පරිදි රාජ්‍ය සම්පත් අවභාවිතාව කිරීම නිදහස් සහ සාධාරණ ඡන්ද විමසීමකට බාධාවක් හෙයින් ඒ සම්බන්ධව නිකුත් කරනු ලබන විධාන කඩකිරීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අමතරව මැතිවරණ වරදක් ලෙසද සලකා මැතිවරණ නීතිය යටතේ වගකීමට යටත් කිරීම.

- **වත්කම් බැරකම් ප්‍රකාශ ලබාදීම අනිවාර්ය කිරීම**

අපේක්ෂකයින්ගේ වත්කම්/ බැරකම් ප්‍රකාශ නාමයෝජනා පත්‍රය සමඟ භාර දීම අනිවාර්ය කිරීම හා ඒ තුළින් පසු අවස්ථාවක දී වැරදි හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම වළක්වාලීම හා එසේ සිදු කර තිබේ නම් එම තැනැත්තන්ට ධුරය අහිමිව වන ලෙස හා එම තැනැත්තන්ට එරෙහිව මැතිවරණ නීතිය යටතේ ක්‍රියා කිරීම සඳහා නීති සම්පාදනය කිරීම.

11 වන පිටුවට...

# මැතිවරණ අව-සංස්කෘතියක් නොව නියෝජිතවරණ යහ-සංස්කෘතියක් සඳහා

**ධම්ම දිසානායක**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
දේශපාලන විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශය - කොළඹ විශ්ව විද්‍යාලය

දීර්ඝ කාලයක් මුළුල්ලේ මෙරට මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පවත්නා මැතිවරණ නීතිරීති සංශෝධනය කිරීම මූලිකම අවශ්‍යතාවක්ව පැවතුණි. පිළිගත් දේශපාලන පක්ෂ, විවිධ පාර්ශ්වකාර කණ්ඩායම් වෙතින් ද මැතිවරණ නීතිරීති සංශෝධනවලට පියවර ගන්නා ලෙස මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කොට තිබුණි. පවත්නා තත්ත්වය සැලකිල්ලට ගත් මැතිවරණ කොමිෂන් සභාව අදාළ නීතිරීති සංශෝධනය කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා තිබුණි.

මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීතිරීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ තේරීම්කාරක සභාවක් මේ වන විට පත් කොට ඇති අතර කාරක සභාව එම කටයුතුවල නිරතව සිටී. මෙම කාරක සභාව පත්කොට ඇත්තේ 2021 අප්‍රේල් 5 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යෝජනාවකට අනුවය. මීට පෙර 2006 අප්‍රේල් මස 4 වැනි දා ද මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරන ලදුව එහි අතුරු වාර්තාව නිකුත් වුයේ 2007 ජුනි 5 වැනිදා ය. එයටත් පෙර 2003 අගෝස්තු 20 වැනි දින පාර්ලිමේන්තු යෝජනාවක් මගින් මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ විශේෂ කාරක සභාවක් පිහිටුවනු ලැබූ අතර, එහි අතුරු වාර්තාව මුද්‍රණයට ඉදිරිපත් කළේ 2004 ජනවාරි 23 වැනිදා ය.

මේ කාරක සභා තුනේම විශේෂ ලක්ෂණ කීපයක් විය. දිනේෂ් ගුණවර්ධන මහතා කාරක සභා තුනේම සභාපති ධුරය හෙබවීම ඉන් එකකි. කාරක සභා තුනම හුදු මැතිවරණ ප්‍රතිසංස්කරණ අරබයා පමණක් පත් කිරීම තවත් විශේෂත්වයකි. කාරක සභා තුනම නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධාර්මික පදනම් මත නොපිහිටා හුදු නියෝජිතවරණවලට අදාළ තාක්ෂණික කාරණා පිළිබඳ පමණක් අවධානය යොමු කිරීම ඊළඟ විශේෂත්වය. අනෙක් විශේෂත්වය වන්නේ සිවිල් සමාජ සංවිධාන හෝ දේශපාලන පක්ෂ කිසිවෙකින්වත් රටේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ එක් මාධ්‍යයක් පමණක් වන නියෝජිතවරණ තාක්ෂණය ගැන කතා කිරීමෙන් එහාට ගිය නියෝජන ප්‍රජාතන්ත්‍රීය ප්‍රතිමාන මත පදනම්ව යෝජනා ඉදිරිපත් නොකිරීම සහ ඒ පිළිබඳ කථිකාවක් ආරම්භ නොකර සිටීමය. මින් කියැවෙන්නේ "මෙදා පොටේ දෙනව බැටේ" වර්ගයේ මැතිවරණ අව-සංස්කෘතියක් මිස දියුණු සහ හරයාත්මක නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතියක් සඳහා වන සංකල්ප සහ තේමා කළමනාකරණයක් සඳහා කිසිවකුත් අවධානය යොමු කොට නොමැති බවය.

කවුරුත් භාවිතා කරන "මැතිවරණ" යන්න වෙනුවට මෙම ලිපිය තුළ "නියෝජිතවරණ" යන වචනය මා අතින් කියවෙන්නේ සහ ලියැවෙන්නේ කවර හේතුවක් නිසා ද යන්න පැහැදිලි කළ යුතු යැයි සිතමි. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට අප කැමති නම් අප, එනම් මහජනයා විසින් තෝරා පත්කරගත යුත්තේ අපට ඉහළින් සිටින මැති මැතිනියන් නොව අප හා සමාන ජනතා නියෝජිතයන්ය. එනිසා ම පැවැත්විය යුත්තේ මැතිවරණ නොව නියෝජිතවරණ ය. වචන ගැන පවා මේ තරම් අවධානය යොමු කළ යුත්තේ 1931 අපට ලැබුණේ පාලකයන් හෝ මැති මැතිනියන් සිංහාසනාරූඪ කිරීමේ මැජික් යෂ්ටියක් නොව නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතියක් තනා ගැනීමේ ඡන්ද බලයක් වන නිසාය. එය භාවිතා කොට අප තෝරාගත යුත්තේ පාලකයන් හෝ මැති මැතිනියන් හෝ නොව ජනතා නියෝජිතයන්ය. ඒ නියෝජිතයන් තෝරා ගන්නා ක්‍රමය අප නම් කළ යුත්තේ නියෝජිතවරණ මිස මැතිවරණ කියා නොවේ ය. අප පටන්ගත යුත්තේ ඒ ආකාරයේ තියුණු විමර්ශනාත්මක භාවිතයකින්ය.

නැවත මුල් කාරණයට යමු. 2003 සිට මේ දක්වා වු "මැතිවරණ කාරක සභා" හෝ අනෙකුත් අදාළ පාර්ශ්ව නියෝජන සිද්ධාන්තය සහ එහි වැදගත්කම, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සහ එහි සමාජ, දේශපාලන, ආර්ථික ප්‍රගමන හැකියාව සහ ධාරිතාව ගැන අවධානය යොමු නොකිරීම සහ හුදු "මැතිවරණ ප්‍රතිසංස්කරණ" ගැන පමණක් අවධානය යොමු කිරීම තුළින් රටට ලැබී ඇත්තේ අවවර්ධිත අවසංස්කෘතික ප්‍රාදේශීය, පළාත් සහ ජාතික නියෝජන ආයතනයන් ය, බොහෝ විට නියෝජිතයන් නොව හිතුවක්කාර ලෙස හැසිරෙන ප්‍රාදේශීය, පළාත් සහ ජාතික මට්ටමේ පාලකයන්ය, මැරයන්ය, චෞරයන් ය. එබැවින් මෙදා පොටේවත් අප මේ කාරක සභාව මෙහෙයවා ගත යුත්තේ, නැතහොත් යොමු කරවා ගත යුත්තේ පාලකයන් නොව, නියෝජිතයන් සහිත නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතියක් සඳහා අනුබල ලැබෙන ප්‍රතිසංස්කරණ ඇති කරවා ගැනීම දෙසටය. නියෝජිතවරණ මගින් නියෝජන සිද්ධාන්ත සහ ආයතනවල ඉරණම තීරණය කරනවා වෙනුවට නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී සිද්ධාන්ත මගින් නියෝජිතවරණවල ආකෘතිය සහ ක්‍රියාකාරීත්වය තීරණය කරන තැනකට අප යා යුතුමය.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මූලික ලක්ෂණයක් විය යුත්තේ ඊට අදාළ විධිමත් සහ මානුෂීය සමාජ සංස්කෘතියක් සඳහා උපකාරීවන ව්‍යවස්ථාවක් සම්පාදනය කොට ගෙන ඊට අනුව ආණ්ඩුකරණය සිදු කිරීම ය. එහි දී ප්‍රජාතන්ත්‍රවාදයට සහ එහි පිළිවෙළට ව්‍යවස්ථා විරෝධී ලෙස බාධා කිරීමත් ව්‍යවස්ථානුකූල ලෙස බාධා කිරීමත් යන දෙකම වැරදි ය. එසේම නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ඇගයුම් නොතකා සහ මඟහැර විවිධ සංශෝධන ගෙන ඒමත් වැරදි ය. ව්‍යවස්ථාව

සහ අනෙකුත් නීති සහ ආයතන අවභාවිතා කිරීමත් වැරදි ය. මේ තත්ත්වය වළක්වා ගැනීමට නම් අප කළ යුත්තේ හැම විටම හැම කාර්යකදීම නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම සහ සිද්ධාන්ත මත පිහිටා ඒවා මුල් කොටගෙන ක්‍රියා කිරීමය.

නූතන සමාජ සන්දර්භය තුළ ප්‍රජාතන්ත්‍රවාදය සහ නියෝජනය යනු මානව අයිතියකි. එසේම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු සහ ආණ්ඩුකරණයක් පවත්වාගෙන යාම ජනයාගේ අයිතියකි. එසේ වන්නේ සමාජයක සමාජයීය, දේශපාලන සහ ආර්ථික සංවර්ධනය උදෙසා ප්‍රජාතන්ත්‍රවාදය අත්‍යවශ්‍ය කොන්දේසියක් වන නිසා ය. නූතන සමාජයේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැගෙන්නේ නියෝජන ක්‍රම හරහා ය. එය නම් කෙරෙන්නේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යන නමිනි. එබැවින් නියෝජන ක්‍රම සහ නියෝජිතවරණ සකස්විය යුත්තේ ඒ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී අරමුණු සහ වටිනාකම් මත පිහිටා ය. එසේ නැතිව කවුරුන් හෝ නියෝජිත ආයතනයකට පත් කරගන්නේ කවර සරළ ක්‍රමයක් යටතේ ද, කෙසේද යන කරුණු මත පදනම් වී නොවේ ය. මානව අයිතීන්ට සහ මූලික නිදහසට ගරු කිරීම, නිදහස් සහ සාධාරණ නියෝජිතවරණ පැවැත්වීම, දේශපාලන පක්ෂ සහ සංවිධානවල බහුත්වවාදී ගති ලක්ෂණ සුලබ විම, එනම් සර්වාන්තරීය ගති ලක්ෂණ සුලබ වීම, බලතල නිසි ලෙස වෙන්කොට තිබීම, ආණ්ඩුවේ ආයතනවල ස්වාධීනත්වය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආණ්ඩු විසින් හෝ මාධ්‍ය කොම්පැනි විසින් අවහිර කොට නොතිබීම, නීත්‍යනුකූලව ස්ථාපිත කොට ඇති සිවිල් එනම් පුරවැසි අධිකාරියට සියලූ රාජ්‍ය ආයතන අවනත වීම යනු එවැනි වටිනාකම් කීපයක් ය.

නියෝජිතවරණ යනු නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන එක් මාධ්‍යයක් පමණක් මිස එකම මාධ්‍යය නොවේ ය යන්න අප තේරුම් ගත යුතුම කරුණකි. ජනමත විචාරණ, ප්‍රාරම්භන සහ නැවත කැඳවීම යනු තවත් ක්‍රමයෝ වෙති. පළාත්, ප්‍රාදේශීය සහ ප්‍රජා මට්ටම දක්වා නියෝජන සංස්කෘතිය පුළුල් කිරීම සහ හරයාත්මක නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී සංස්කෘතියක් සමාජය තුළ තහවුරු කිරීම සඳහා විවිධ ක්‍රම භාවිත කළ යුතුම ය. එසේම නියෝජිතවරණ ක්‍රමවේද සූක්ෂම කරගැනීම මගින් පමණක් දියුණු ප්‍රජාතන්ත්‍රීය සමාජ සංස්කාතියක් බිහි කරගත නොහැකිය. ප්‍රජාතන්ත්‍රවාදයට පටිපාටිමය ක්‍රම අවශ්‍ය බව ඇත්තකි. එහෙත් හරයාත්මක වටිනාකම් නොමැති නම් ඒ පටිපාටිවලින් ලැබෙන මහා ප්‍රතිඵලයක් නොමැත. පටිපාටි ගොඩනගා ගත යුත්තේ හරයන් ලබා ගැනීමේ අරමුණින් මිස පටිපාටිවලින් නතර වීමට නොවේය.


මෙරට ආණ්ඩු දිගටම උත්සාහ ගෙන ඇත්තේ හරයගෙන් වියෝ වුණු විසිරුණු සහ ඒකාබද්ධ නැති පටිපාටි එදිනෙදා බල අවශ්‍යතා සඳහා සකසා ගැනීමට ය. ඥානය සම්පාදනය පදනම් කර නොගත් අධ්‍යාපන පරිපාටි නිෂ්ඵල වන්නේ යම් සේද ප්‍රජාතන්ත්‍රවාදය සහ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී සිද්ධාන්තමය කරුණු සහ අරමුණු සාධනය සඳහා නොවන "මැතිවරණ" පටිපාටි ද නිෂ්ඵල බව මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ හා නීතිරීතිවල ප්‍රතිසංස්කරණ හඳුනාගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව අනිවාර්යයෙන් ම තේරුම් ගත යුතු ය. එසේ නොවුණහොත් මේ රටේ දිගටම නඩත්තු වෙන්නේ මෙදා පොටේ දෙනව බැටේ පන්නයේ මැතිවරණ මිස නියෝජන සිද්ධාන්තය මත රට ගොඩ නගා ජනයාට ප්‍රීතිමත් සහ ගෞරවාන්විත ජීවිත ලබා දෙන හරයාත්මක ප්‍රජාතන්ත්‍රීය සංස්කෘතියක් නම් නොවේ ම ය. එබැවින් දක්වා ඇති කරුණු කෙරෙහි මැතිවරණ නීති සංශෝධනය කිරීම සඳහා පත්කොට ඇති මෙම තේරීම් කාරක සභාවේ ප්‍රමුඛ අවධානය යොමු වීම අත්‍යාවශ වේ.

## මැතිවරණ කොට්ඨාස සහ පරිපාලන දිස්ත්‍රික්කය අනුව ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව

| මැතිවරණ කොට්ඨාශය හා පරිපාලන දිස්ත්‍රික්කය | ඡන්ද හිමියන් සංඛ්‍යාව | |
|---|---|---|
| | 2020 | 2021 |
| කොළඹ | 1,724,061 | 1,735,315 |
| ගම්පහ | 1,804,102 | 1,814,507 |
| කළුතර | 981,364 | 985,948 |
| මහනුවර | 1,140,168 | 1,151,796 |
| මාතලේ | 413,096 | 416,249 |
| නුවරඑළිය | 583,566 | 586,089 |
| ගාල්ල | 876,391 | 879,992 |
| මාතර | 664,030 | 667,904 |
| හම්බන්තොට | 499,586 | 503,184 |
| යාපනය | 563,193 | 572,446 |
| යාපනය දිස්ත්‍රික්කය | 469,822 | 476,792 |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | 93,371 | 95,654 |
| වන්නි | 290,169 | 293,682 |
| වවුනියාව දිස්ත්‍රික්කය | 123,785 | 124,735 |
| මන්නාරම දිස්ත්‍රික්කය | 85,948 | 86,879 |
| මුලතිව් දිස්ත්‍රික්කය | 80,436 | 82,068 |
| මඩකලපුව | 419,345 | 427,125 |
| දිගාමඩුල්ල (අම්පාර) | 523,148 | 529,045 |
| ත්‍රිකුණාමලය | 293,607 | 297,946 |
| කුරුණෑගල | 1,360,627 | 1,375,457 |
| පුත්තලම | 628,640 | 637,009 |
| අනුරාධපුර | 701,827 | 710,248 |
| පොළොන්නරුව | 336,701 | 339,428 |
| බදුල්ල | 675,924 | 680,892 |
| මොණරාගල | 377,688 | 381,252 |
| රත්නපුර | 888,722 | 895,994 |
| කෑගල්ල | 690,101 | 694,188 |
| පරිපූරක ලැයිස්තුව | 3 | - |
| **මුළු එකතුව** | **16,436,059** | **16,575,646** |

# FEMBoSA

# දකුණු ආසියාතික මැතිවරණ කළමනාකරණ ආයතන සංසදය



එස්. අච්චුදන්
නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්
(පළාත් පාලන මැතිවරණ /විශේෂ ව්‍යාපෘති)

සාර්ක් (SAARC) රටවල්වල මැතිවරණ කළමනාකරණ ආයතනවල ප්‍රධානීන්ගේ ප්‍රථම රැස්වීම 2010 වර්ෂයේ බංගලාදේශයේ ඩකා නුවර පැවැති අවස්ථාවේ දකුණු ආසියාතික මැතිවරණ කළමනාකරණ සංවිධාන සියල්ල ඒකාබද්ධ කොට සංසදයක් පිහිටුවිය යුතු යැයි මැතිවරණ කළමනාකරණ සංවිධානවල ප්‍රධානීන් විසින් තීරණය කරන ලදී. ඒ අනුව මෙම සංවිධානය දකුණු ආසියාතික මැතිවරණ කළමනාකරණ ආයතන සංසදය (FEMBoSA) යනුවෙන් නම් කළ අතර, 2010 වර්ෂයේ බංගලාදේශයේ පැවැති රැස්වීම මෙම සංසදයේ ප්‍රථම වාර්ෂික සමුළුව වශයෙන් පිළිගනු ලැබේ.

මෙම සංසදයේ සාමාජික මැතිවරණ කළමණාකරණ ආයතන වශයෙන් ඇෆ්ගනිස්ථානය, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පාකිස්ථානය සහ ශ්‍රී ලංකාව යන රටවල්වල මැතිවරණ කළමනාකරණ ආයතන නියෝජනය වේ.

දකුණු ආසියාතික මැතිවරණ කළමනාකරණ ආයතන සංසදය, (FEMBoSA) ප්‍රජාතන්ත්‍රීය මූල ධර්ම හා ක්‍රියාකරකම් මත ක්‍රියාත්මක වේ. සංවිධානයේ සාමාජික රටවල මැතිවරණ කළමණාකරණ ආයතන සමඟ සහයෝගීතාව වර්ධනය කිරීම, ස්වකීය අත්දැකීම් හුවමාරුව ඒ අතරින් මූලික වන අතර මේ සම්බන්ධව ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් මඟින් සාමාජික රටවල මැතිවරණ කාර්ය මණ්ඩලවල දැනුම හුවමාරු වීම සෑම මැතිවරණ කළමණාකරණ ආයතනයකටම මනා පිටුවහලක් වී ඇත.

මෙම සංසදය පිහිටුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සියලුම සාමාජික රටවල් තමන්ගේ රටවල්වල ඡන්ද හිමියන්ගේ ජාතික දිනය වාර්ෂිකව සමරනු ලබයි. තවද, ප්‍රජාතන්ත්‍රවාදය සහ මැතිවරණ අධ්‍යයනය සඳහා වන දකුණු ආසියානු ආයතනය (South Asia Institute for Democracy and Electoral Studies-SADLES) නේපාලයේ පිහිටුවීම, මෙම කලාපයේ මැතිවරණ කළමනාකරණ සංවිධාන අතර මනා සහයෝගීතාවක් ඇති වීම සහ සාමාජික රටවල්වල අධ්‍යාපන විෂය මාලාවලට මැතිවරණ ක්‍රම සම්බන්ධව විෂය කරුණු ඇතුළත් කර ගැනීම යනාදිය මෙම සංසදය පිහිටුවීමෙන් අත්පත් කර ගන්නා ලද වැදගත් ජයග්‍රහණ වශයෙන් සඳහන් කළ හැකිය. නිවෙස් අහිමි අය, විශේෂ අවශ්‍යතා ඇති අය, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, තරුණ/කාන්තා ප්‍රජාව සහ ආන්තික ජන කොටස් ඇතුළත් මැතිවරණ ක්‍රමයක් (All inclusive elections) ඇති කිරීම සම්බන්ධව සාමාජික රටවල්වල මැතිවරණ කළමනාකරණ සංවිධාන උත්සාහ දරමින් සිටී. මෙයට අමතරව සාමාජික රටක මැතිවරණයක් පැවැත්වීමේ දී අනෙක් සාමාජික රටවල්වල නියෝජිතයන් මැතිවරණ නිරීක්ෂණය සහ මැතිවරණ ක්‍රමවේද පිළිබඳ අධ්‍යයන කටයුතුවල නිරත කරවීම මඟින් අන්‍යෝන්‍ය සහයෝගීතාව වැඩි දියුණු කිරීම හා වර්ධනය කිරීම සහ ඡන්ද හිමියන් ලියාපදිංචිය, මැතිවරණ ක්‍රමවේද හා ඡන්ද හිමියන් දැනුම්වත් කිරීම පිළිඳව මැතිවරණ කළමනාකරණ සංවිධානවල නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය වැනි වැඩසටහන් පැවැත්වීම කරනු ලැබේ.

දකුණු ආසියාතික මැතිවරණ කළමනාකරණ සංසද රැස්වීම් මාලාවේ න්‍යාය පත්‍රය, වර්තමානයේ කලාපයේ පවතින මැතිවරණ කළමනාකරණය සහ මැතිවරණ ක්‍රියා පරිපාටිය හා සම්බන්ධ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමේ වේදිකාවක් බවට පත්ව තිබේ. එසේම අදාළ වර්ෂය සඳහා නායකත්වය එම වර්ෂයේ සමුළුව සංවිධානය කර පවත්වන රාජ්‍යයේ මැතිවරණ කළමනාකරණ සංවිධානයට ලබා දීම, මීළඟ වර්ෂයේ සමුළුව පවත්වන්නේ කිනම් රාජ්‍යයක ද යන්න සහ මීළඟ රැස්වීමට අදාළ තේමාව තීරණය කිරීම යන කරුණුවලින් සහ පූර්ව වර්ෂයේ මෙම සංසදයේ ක්‍රියාකාරිත්වයේ ප්‍රගතිය පිළිබඳව අධ්‍යයනය කිරීම සහ මීළඟ වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් සැළසුම් කිරීම යන කරුණු වලින් න්‍යාය පත්‍රය සංගෘහිත වේ. ඒ අනුව මෙම වාර්ෂික සමුළුව සාමාජික රටවල මැතිවරණ කළමණාකරණයට ඉතා වැදගත් තොතැන්නක් බවට පත්ව තිබේ.

2013 වර්ෂයේ තිම්පු හි පැවැත් වූ සිව්වන වාර්ෂික සමුළුවේ දී බංගලාදේශ මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම සංසදය වෙනුවෙන් ලාංඡනයක් යෝජනා කළ අතර ඒ අනුව සකස් කරන ලද එම ලාංඡනය සියලු සාමාජික රටවල් විසින් ඒකමතිකව පිළිගනු ලදුව එය මෙම සංසදයේ නිල ලාංඡනය වශයෙන් භාවිතා වේ.

මෙම ලාංඡනයේ සඳහන් √ සළකුණ මැතිවරණය සහ රන් පැහැති මුතු 08, සාමාජික රටවල් 08 සහ එම මුතු අතර පවතින සමාන පරතරය. අපක්ෂපාතී බව ප්‍රජාතන්ත්‍රවාදය සහ මුතු අතර පවත්නා අවකාශය විනිවිදභාවය සහ මුතු රවුමක හැඩයෙන් තිබීම සහයෝගීතාව ද පෙන්නුම් කරයි.

දකුණු ආසියානු මැතිවරණ කළමනාකරණ සංසදයේ නායකත්වය සාමාජික රටවල් අතර චක්‍රීය ආකාරයෙන් හුවමාරුවේ. වාර්ෂික සමුළුව සංවිධානය කරනු ලබන රට එම වර්ෂයට අදාළ නායකත්වය දරන අතර, වාර්ෂික රැස්වීම් මාලාව පැවැති රටවල් පිළිබඳව විස්තර පහත සඳහන් වේ.

**1 වන රැස්වීම**
බංග්ලාදේශය
2010 මැයි 29-30

**2 වන රැස්වීම**
පාකිස්ථානය
2011 සැප්තැම්බර් 08-10

**3 වන රැස්වීම**

ඉන්දියාව

2012 අප්‍රේල් 30-මැයි 02

**4 වන රැස්වීම**

භූතානය

2013 ඔක්තෝබර් 01-03

ප්‍රශස්ත මැතිවරණ භාවිතාවන් සඳහා දකුණු ආසියානු අත්දැකීම් හා සම්පත් හුවමාරු කර ගැනීම

(Sharing Experiences and Resources for Better Electoral Practices in South Asia)

**5 වන රැස්වීම**

නේපාලය

2014 නොවැම්බර් 29-30

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා ප්‍රචාරක වියදම් නියාමනය

(Regulating Campaign Finance, Ensuring and Fair Election)




**6 වන රැස්වීම**

ශ්‍රී ලංකාව

2015 ඔක්තෝබර් 01-02

නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා මැතිවරණ කළමනාකරන සංවිධානවල ස්වාධීනත්වය සහ නිදහස

(Autonomy and Independence of EMBs for ensuring free and fair elections)



**7 වන රැස්වීම**

මාලදිවයින

2016 අගෝස්තු 02-04

විශ්වාසනීය මැතිවරණයක් සඳහා තාක්ෂණය

(Technology for credible Elections)



**8 වන රැස්වීම**

ඇෆ්ගනිස්ථානය

2017 සැප්තැම්බර් 23-26

මැතිවරණ ආරවුල් නිරාකරණය සහ කිසිදු ඡන්දදායකයෙකු අත්නොහැරෙන මැතිවරණ ක්‍රියාවලියක්

(Election Dispute Resolution and No Voter to be Left Behind)




**9 වන රැස්වීම**

බංග්ලාදේශය

2018 සැප්තැම්බර් 05-07

1.මැතිවරණ ක්‍රියාවලියේ විනිවිදභාවය

(Transparency in electoral process)

2.මැතිවරණ ක්‍රියාවලියේ දී පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගැනීම

(Engaging electoral stakeholders)




**10 වන රැසවීම**

ඉන්දියාව

2020 ජනවාරි 24

ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම

(Strengthening Institutional Capacity)



**11 වන රැස්වීම**

(මාර්ගගත ක්‍රමය මඟිනි)

භූතානය

2021 අගෝස්තු 11

මැතිවරණවල දී තාක්ෂණය භාවිතා කිරීම

(Use of Technology in Election)



2019 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබූ රැස්වීම විවිධ හේතුන් නිසා නොපැවැත් වු අතර එය 2020 ජනවාරි 24 දින ඉන්දියාවේ නවදිල්ලි නුවර දී ඉන්දියානු මැතිවරණ කොමිසමේ සංවිධානය යටතේ පවත්වන ලදී. ඒ සමඟම 2021 වර්ෂයේ මුල් භාගයේ පැවැත්විය යුතු 11 වන රැස්වීම කොරෝනා වසංගතය හේතුවෙන් කල් දැමීමට සිදුවූ අතර එය 2021 අගෝස්තු 11 වන දින මාර්ගගත ක්‍රමය මඟින් භූතාන මැතිවරණ කොමිසමේ නායකත්වයෙන් පැවැත්විය. තව ද, සංසදයේ නායකත්වය එක් වර්ෂයකට පමණක් සීමා වුව ද අනපේක්ෂිතව ලෝකයේ සෑම රටක්ම මුහුණ දුන් කොරෝනා වසංගතය සහ සාමාජික රටවල් කිහිපයක මැතිවරණ පැවැත්වීමේ අපේක්ෂාව හේතු කොටගෙන මෙවර අවුරුදු 02 ක කාලයක් සඳහා සංසදයේ නායකත්වය භූතානයට හිමිව ඇත. ඒ අනුව, සංසදයේ 12 වන සමුළුව 2023 වර්ෂයේ පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

2021 අගෝස්තු මස 11 දින මාර්ගගතව පැවති සංසදයේ 11වන සමුළුවේ තේමාව වී තිබුණේ "මැතිවරණවල දී තාක්ෂණය භාවිතාව" යන්න යි. මෙම තේමාවට සමගාමීව ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව විසින් "සමාජ මාධ්‍ය ඇතුළු මාධ්‍ය නියාමනයේ දී තාක්ෂණය භාවිතා කිරීම" යන මාතෘකාව යටතේ කරුණු ඉදිරිපත් කොට තිබුණි.

මැතිවරණ කාල සීමාවක දී මාධ්‍ය ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කිරීමේ අරමුණ වන්නේ, මාධ්‍ය භාවිතාව තුළින් තරග කරනු ලබන සියලු පාර්ශ්වවලට සම අවස්ථා සලසා දීමත් එක් පක්ෂයක් හෝ එක් අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය කිරීමට හෝ අගතියක් සිදු කිරීමට නොහැකි වන ආකාරයට මාධ්‍ය භාවිතාව හැසිරවීමයි. වෙනස්වන තාක්ෂණික දියුණුවට අනුව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය, විශේෂයෙන්ම සමාජ මාධ්‍ය ජාලා නිරීක්ෂණය කිරීම ඉතාමත් අභියෝගාත්මක කටයුත්තකි. මිලියන 06 ක් පමණ වූ ශ්‍රී ලංකාවේ නිවෙස්වලින් මිලියන 4.8 ක් රූපවාහිනී යන්ත්‍ර භාවිතා කරනු ලැබේ. ඒ සමඟම රූපවාහිනී නාලිකා 40 ක්, කේබල් සහ චන්ද්‍රිකා තාක්ෂණ රූපවාහිනී සේවා 08 ක් ද පවතී. ශ්‍රී ලංකාවේ මිලියන 11 ක පමණ ජනතාව වෙබ් අඩවි පරිශීලනය කරති. මිලියන 7.7 මුහුණු පොත පරිශීලනය කරන අතර සේවා සපයන්නන් 40 දෙනෙකු හසුරුවන ගුවන් විදුලි නාලිකා 100 ක් පමණ දියුණු තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් සිටී. මෙම වාතාවරණය තුළ මැතිවරණ කාල සීමාවේ දී මාධ්‍ය නිරීක්ෂණය කිරීම ඉතාමත් සංකීර්ණ හා අභියෝගාත්මක කටයුත්තක් වේ.

ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ)(5)(අ) අනුව මාධ්‍ය උපමාන සකස් කොට ප්‍රසිද්ධියට පත් කරනු ලබන අතර එම උපමාන නියාමනය කිරීමේ ක්‍රමවේදයක් ද පවත්වාගෙන යනු ලබයි. මේ සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, සියළුම විද්‍යුත්/මුද්‍රිත මාධ්‍ය ආයතනවල ප්‍රධානීන්/ප්‍රවෘත්ති සංස්කාරකවරුන්, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් සමාජ මාධ්‍ය හිමිකරුවන් හා පරිශීලකවරුන්ගේ සහය ද ලබා ගෙන තිබූ අතර ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සහය ඇතිව සියළුම රූපවාහිනි නාලිකාවල දෛනික විකාශයන් නිරීක්ෂණය කොට ඒ සම්බන්ධ වාර්තා ලබාගෙන සියළුම පක්ෂ/ අපේක්ෂකයින් සඳහා මාධ්‍ය උපමාන උල්ලංඝණය නොවන ආකාරයේ සම බිමක් නිර්මාණය කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබුණි.

අවසන් වරට ශ්‍රී ලංකාවේ පැවැති පාර්ලිමේන්තු මැතිවරණය කොවිඩ් වසංගතය මධ්‍යයේ දී පැවැත් වූ බැවින් මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පිරිදි අපේක්ෂකයන්, දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් තමන්ගේ ප්‍රතිපත්ති ජනතාවට ප්‍රකාශ කිරීම සඳහා මහජන රැස්වීම් හෝ මහජන හමුවීම් පැවැත්වීමේ දී සෞඛ්‍යාරක්ෂිත ක්‍රම අනුගමනය කිරීම සඳහා ස්වයං යොමුවීමක් දක්නට ලැබුණි. මෙවැනි අභියෝගාත්මක මැතිවරණ කාල සීමාවන්වල දී මාධ්‍ය භාවිතය වැඩිවන බැවින් ඒවායේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම සඳහා තාක්ෂණික යටිතල පහසුකම්, දැනුම සහ නීති විධිවිධාන මැතිවරණ කළමනාකරණ සංවිධාන විසින් දියුණු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් 11 වන දකුණු ආසියාතික මැතිවරණ කළමනාකරණ සංසදයේ රැස්වීමේ දී ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව ඒ පිළිබඳ ඉදිරිපත් කිරීමක් කර තිබුණි.

දකුණු ආසියාතික මැතිවරණ කළමනාකරණ සංසදය 2010 වර්ෂයේ ආරම්භ කළ දින සිට මේ දක්වා මැතිවරණ කළමනාකරණයේ දී ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කිරීමටත්, සාමාජික රටවල් අතර සහයෝගීතාවය දියුණු කිරීමටත් කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව ප්‍රකාශ කිරීම අතිශයෝක්තියක් නොවනු ඇත.



FEMBoSA (දකුණු ආසියානු මැතිවරණ කළමනාකරණ ආයතන බලධාරීන්ගේ සංසදය) 11 වැනි වාර්ෂික රැස්වීම 2021.08.11 ZOOM තාක්ෂණය භාවිතා කරමින් පැවැත්වු අවස්ථාව

## මැතිවරණ ඉතිහාසයේ රිදී රේඛාව

# මැතිවරණ අල්ලසට

## එරෙහිව මොණරාගල මැතිවරණ පෙත්සම් නඩුව

**රෝහණ හෙට්ටිආරච්චි**

විධායක අධ්‍යක්ෂ - නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (PAFFREL)

2018 වර්ෂයේ පෙබරවාරි 10 වන දින පැවැති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ශ්‍රී ලංකාවේ මැතිවරණ ඉතිහාසයේ තීරණාත්මක ඡන්ද විමසීමකි. එකී තීරණාත්මක බවට බලපෑ ප්‍රධාන හේතු කිහිපයකි. ඉන් පළමුවැන්න වනුයේ 2018 පැවැති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම එකී මැතිවරණ ක්‍රමයේ නව සංශෝධන සහිතව පැවැති පළමු ඡන්ද විමසීම වීමයි. එම නව මැතිවරණ ක්‍රමය මගින් සමානුපාතික පදනම සහිත මිශ්‍ර ක්‍රමයක් හඳුන්වාදෙන ලදි. එමෙන්ම නව ක්‍රමය මගින් පළමු වතාවට කාන්තා නියෝජනය සඳහා 25% ක අනිවාර්ය කෝටාවක් හඳුන්වාදෙන ලදි. මෙම ක්‍රමයට අවශේෂී තවත් බොහෝ වෙනසක්කම් මැතිවරණ ක්‍රමයට එක් වූ අතර මෙම මැතිවරණයට අදාළ තෙවන ප්‍රධානම කරුණු වනුයේ මැතිවරණයට තරග කළ අපේක්ෂකයෙකු ඡන්ද දායකයන්ට අල්ලස් ලබාදීම අභියෝගයට ලක් කරමින් මොණරාගල මහාධිකරණය හමුවේ පැවැරූ නඩුවේ ප්‍රතිඵලයක් ලෙස අදාළ සභිකයාගේ සභික ධුරය අහිමි කිරීමයි. මෙම ලිපියේ අරමුණ එම නඩුකරය ඊට පාදක වූ කරුණු හා නඩු තීන්දුව සමග ප්‍රජාතන්ත්‍රවාදී සමාජයට ලබාදී ඇති ජයග්‍රහණය පිළිබඳ සාකච්ඡා කිරීමයි.

### නඩුවේ පසුබිම

වෙනත් බොහෝ මැතිවරණවල දී මෙන්ම 2018 පළාත් පාලන ඡන්ද විමසීමේ දී ද ඡන්ද දායකයන්ට අල්ලස් ලබාදීම පිළිබඳ පැමිණිලි සියලූ නිරීක්ෂණ සංවිධාන වෙත ගලා එමින් තිබුණි. එකී පැමිණිලි අතර මොණරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මදුරුකැටිය කොට්ඨාසයට තරග වදින අපේක්ෂකයෙකු පළාත් පාලන ඡන්ද විමසීමේ දී විශ්වාස කළ නොහැකි මට්ටමේ මුදල් ප්‍රමාණයක් භාවිත කරමින් විවිධ ආකාරයේ අල්ලස් ලබා දෙමින් සිටින බව වාර්තා විය. ඒ අතරේ නිවාස සෙවිලි ද්‍රව්‍ය, සිමෙන්ති , ඇතුලු ගොඩනැගිලි ද්‍රව්‍ය, ළමා මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය උපකරණ හා විදුලිය නොමැති නිවාස සඳහා විදුලිය ද ජලය නොමැති නිවාස සඳහා ජල සම්බන්ධතා ද ලබා දෙමින් සිටින බවයි. මේ පිළිබඳව PAFFREL (නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය), CMEV (මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය), ආයතන දෙකම මැතිවරණ කොමිසමට පැමිණිලි කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹින් විමර්ශන නිලධාරියෙකු මොණරාගල ප්‍රදේශයට යවා විශේෂ විමර්ශනයක් කිරීමට මැතිවරණ කොමිෂම කටයුතු කරන ලදි. මේ පිළිබඳව තවදුරටත් කරුණු සොයා බැලීම සඳහා පැෆ්රල් සංවිධානය තොරතුරු දැනගැනීමේ පනත භාවිත කරමින් ජල සම්පාදන මණ්ඩලයට හා විදුලිබල මණ්ඩලයට ඉල්ලුම්පතක් යොමු කරමින් විමසා සිටියේ මෙම කොට්ඨාසය තුළ මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ජලසම්බන්ධතා හා විදුලි සම්බන්ධතා ලබාගෙන ඇත්තේ කවුරුන්ද? ඒවා සඳහා ගෙවීම් කරනු ලැබුවේ කවුරුන්ද? යන්නයි. මෙම විමසීමට අනුව එක් දිනක් තුළ අදාළ කොට්ඨාසයේ විශාල පිරිසකට ජල හා විදුලි සම්බන්ධතා ලබා දී තිබූ අතර ඒ සඳහා ගෙවීම් කර තිබුණේ එක් පුද්ගලයෙකු බවයි. ඒ අනුව ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී ඡන්ද දායකයින්ට අල්ලස් ලබාදුන් බව ඔප්පු කිරීමට ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි ලබා ගැනීමට හැකිවිය. මෙවැනි නඩුකරවල දී මුහුණදෙන ප්‍රබලම අභියෝගය වනුයේ අල්ලස් ලබාගත් කිසිවෙකු සාක්ෂි ලබාදීමට ඉදිරිපත් නොවීමයි. තොරතුරු දැනගැනීමේ පනතේ ආශිර්වාදයෙන් අපට එය ජයගත හැකිවිය. ඊළග අභියෝගය වූයේ PAFFREL (නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය)හෝ CMEV (මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය) ආයතන ලෙස අපට අධිකරණයේ නඩු පැවරීමට නීතිමය හැකියාවක් නොමැතිකමයි. ඒ සඳහා නොබියව එකඟතාව පළ කරනු ලැබුවේ මොණරාගල ප්‍රදේශීය සභාවේ මදුරුකැටිය කොට්ඨාසයේ දෙවැනියාට වැඩිම ඡන්ද ලබාගත් එමෙන්ම අපට නිරන්තර පැමිණිලි ඉදිරිපත් කළ සුනිල් ශාන්ත මහතායි. ඒ අනුව ඒ මහතාගේ සහය ඇතිව මොණරාගල මහාධිකරණයේ එකී ඓතිහාසික අල්ලස් නඩුව ගොණු කරන ලදී. නඩුකරය අතරතුර දී අප මුහුණදුන් අභියෝග මෙම ලිපිය තුළ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු නොවන අතර එහි ලබාගත් ජයග්‍රහණ හා එය ඉදිරියට බලපෑ හැකි ආකාරය සාකච්ඡා කිරීමට අපේක්ෂා කරමි.

### මෙම නඩුකරය තුළ අවධානයට යොමු වූ ප්‍රධාන කරුණු

1. මැතිවරණයක දී ඡන්ද දායකයාට තම නිදහස් තීන්දුව ගැනීමට බලපෑම් එල්ල විය හැක්කේ මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු කාලය එනම් මැතිවරණ කාලසීමාව පමණක් නොව ඊට පෙරද එකී බලපෑම ඇතිවිය හැකි බව.
2. ඉතා දුෂ්කර ආර්ථික මට්ටමක සිටින ජනතාවකට භෞතික ආධාර ලබාදීමෙන් ඡන්ද දායකයන්ට බලපෑමක් එල්ල විය හැකි බව.
3. මෙවැනි අල්ලස් නඩුවක් ඔප්පු කිරීමේ දී අදාළ අපේක්ෂකයා පෞද්ගලිකවම අල්ලස් දීමට සම්බන්ධ වූ බව ඔප්පු කිරීම අත්‍යවශ්‍ය නොවන බව හා ඔහුගේ නියෝජිතයෙකු හරහා වුවද ඔහු විසින් ලබාදෙන අල්ලසක් ඊට අදාළ වන බව.
4. මෙවැනි නඩුකරයක් ඔප්පු කිරීමේ දී අවශ්‍ය වන්නේ විනිශ්චයකාරවරයා සෑහීමකට පත් වන ප්‍රමාණය ඔප්පු කරනු ලැබුවහොත් ඡන්ද විමසීම් ප්‍රදේශයක යම් කොට්ඨාසයක ඡන්ද විමසීම නිශ්ප්‍රභා කළ හැකි බව
5. අපේක්ෂකයන් විසින් ඍජුව හෝ අන්‍යාකාරයකින් යම් මුදලක්, වටිනා ප්‍රතිෂ්ඨාවක් ලබාදීම හෝ තෑග්ගක් ණයක් හෝ පොරොන්දුවක් ලබාදීමත් එසේ ලබාදීමට එකඟ වීමත් සාක්ෂි මගින් ඔප්පු වන්නේ නම් එය දූෂණ ක්‍රියා යටතට වැටෙන අල්ලස් යන වරදට සම්බන්ධ වන බව
6. අපේක්ෂකයා වෙනුවෙන් මුදල් ගෙවා ඇති පුද්ගලයා එසේ මුදල් වැය කිරීමට ආර්ථික හැකියාවක් නොමැති පුද්ගලයෙකු බව හා ඔහු අපේක්ෂකයාගේ ආධාරකරු වන බව පැමණිල්ලේ සාක්ෂිවලින් සනාථ කර ඇති බව
7. අදාළ කාල සීමාව තුළ මෙම අපේක්ෂකයන් ඍජුව හෝ අන්‍යාකාරයකින් ඔහුගේ ඡන්ද බල ප්‍රදේශයේ ඡන්ද දායකයින්ට විවිධ ආකාරයේ අල්ලස් ලබා දී ඇති බව.

## පැමිණිලි විනිශ්චයට අදාළව විනිශ්චයකාරතුමාගේ අවධානයට යොමු වූ කරුණු

1. පොලිසිය විසින් කරනු ලැබූ විමර්ශනයට අනුව මෙම අපේක්ෂකයා අල්ලස් නැමැති වරද කර ඇති බව එම විමර්ශනවලින් තහවුරු වන බව ප්‍රකාශ කළ ද එකී වරදට අදාළ අපේක්ෂකයා අත්අඩංගුවට ගැනීමට නීතිමය වශයෙන් හැකියාව තිබුන ද අත්අඩංගුවට ගැනීමක් සිදුකර නොමැති බව.
2. මෙම නඩුවේ දී මැතිවරණ කොමිෂන් සභාවේ ආරවුල් කළමනාකරණ ඒකකයේ සහකාර තේරීම්භාර නිලධාරීගේ විමර්ශන වාර්තාව නඩු තීන්දුව සඳහා පදනම් කරගෙන තිබීම.

## මෙම නඩු තීන්දුව මඟින් මැතිවරණ ක්‍රියාවලියේ පාර්ශ්වකරුවන් වෙත ලබාදෙනු ලබන පණිවුඩ.

1. ඉදිරි ඕනෑම ඡන්ද විමසීමක දී යම් අපේක්ෂකයෙකු හෝ ඔහුගේ ආධාරකරුවෙකු ඡන්ද දායකයාට සෘජුව හෝ අන්‍යාකාරයකින් යම් මුදලක් වටිනා ද්‍රව්‍යයක්, තෑග්ගක්, පොරොන්දුවක්, ලබාදීමක් හෝ එසේ ලබාදීමට එකග වූ බව අධිකරණයේ ඔප්පු වුවහොත් ඔහු හෝ ඇය ජයග්‍රහණය කර තිබුනේද මන්ත්‍රීධුරය අහෝසි වේ. ඒ අනුව ඉදිරියේ දී ඡන්ද අපේක්ෂකයින් විසින් ඡන්ද දායකයන්ට අල්ලස් ලබාදීමෙන් වැළකිය යුතු ය.
2. ඉදිරි මැතිවරණවල දී අපේක්ෂකයන්ට තමාගේ ප්‍රතිවාදී අපේක්ෂකයන් පිළිබඳව විමසිල්ලෙන් සිටීමෙන් ඔවුන් මැතිවරණ අල්ලස් ලබාදුන් බව තහවුරු කරගත හොත් මන්ත්‍රීධුරය අහෝසි කළ හැකි බව . ඒ අනුව අනාගතයේ දී මැතිවරණ කොමිෂන් සභාව හා නිරීක්ෂණ සංවිධානවලට අමතරව අපේක්ෂකයින් හා/ පක්ෂ විසින් සෙසු අපේක්ෂකයින් හා පක්ෂ දෙස විමසිල්ලෙන් සිටීම වැදගත් වේ.
3. මුදල් හා බලය තිබූ පමණින් ඡන්ද විමසීමක් ජයගත නොහැකි බව
4. මැතිවරණ පැමිණිලි විමර්ෂණය සඳහා සහ පසු විපරම් කිරීම සඳහා විධිමත් ආයතනික ක්‍රමවේදයක් සකස් විය යුතු බව.
5. මැතිවරණ පැමිණිලි වඩාත් විධිමත් යාන්ත්‍රණයක් ඔස්සේ අධිකරණය වෙත ගෙන යාමට අවැසි නීතිමය බලය මැතිවරණ කොමිෂන් සභාවට ලබාදීම.
6. මැතිවරණ නඩුකර මාස 6 ක් හෝ ඊට අඩු කාලයක් තුළ විභාග කර අවසන් කිරීමට අවශ්‍ය නීති සම්පාදනය විය යුතු බව.
7. අපේක්ෂකයන් ගේ මැතිවරණ ප්‍රචාරණය අවම කිරීම සඳහා මැතිවරණ ක්‍රමයට කොට්ඨාස පදනම ඇතුලත් කළ ද අපේක්ෂක වියදම් සීමා කිරීමේ නීති සම්පාදනයකින් තොරව එම ක්‍රමවේදය සාර්ථක නොවන බව සහ අපේක්ෂකයන් එය සිය වාසියට ගෙන මුළු මුදල් ප්‍රමාණයක්ම කොට්ඨාසයකට වියදම් කිරීම හරහා ඡන්ද දායකයන් මිල දී ගැනීමට උත්සාහ කළ හැකි බව.

මෙම නඩුකරය හා ඒ තුළින් පැන නැගුණු කරුණු පිළිබඳව බලධාරීන්ගේ අවධානය යොමු කර අවශ්‍ය මැතිවරණ නීතියේ කළ යුතු සංශෝධන ඉදිරියේ දී සිදු කිරීම සඳහා කටයුතු කළ යුතු ය.

**මෙම නඩු තීන්දුවට එරෙහිව වග උත්තරකරු විසින් මේ වන විට ඇපැලක් ගොනුකර ඇති බවද සඳහන් කළ යුතුව ඇත.**

04 වන පිටුවෙන්...

- **මැතිවරණ විනිශ්චය අධිකාරියක් ඇති කිරීමට වූ යෝජනාව**

මැතිවරණ වැරදි, දේශපාලන පක්ෂ ආරවුල් හා නාමයෝජනා නාමයෝජනා සම්බන්ධව ගැටලු කඩිනමින් විසඳා ගැනීම සඳහා සහ දැනට මැතිවරණ සම්බන්ධව පවත්නා නඩු විභාගවල ප්‍රමාදය වළක්වාලීම පිණිස මැතිවරණ විනිශ්චය අධිකාරියක් පිහිටුවීමට යෝජනා කෙරේ.

- **පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ක්‍රමවේදයේ අත්‍යාවශ්‍ය සංශෝධන**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) සම්බන්ධ ගැටලු රාශියක් පැනනැඟී අතර, ඒවා කඩිනමින් විසඳා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඇතුළත් යෝජනා ඉදිරිපත් කරනු ලැබ ඇත.

- **පළාත් සභා ඡන්ද විමසීම කඩිනමින් පැවැත්වීම**

දැනට ක්‍රියාත්මක වන පළාත් සභා සඳහා වසර ගණනාවක් තිස්සේ මහජන නියෝජිතයන් තෝරාපත් කර ගැනීමට අවස්ථාව ලැබී නැත. මේ නිසා පළාත් සභා ඡන්ද විමසීම කඩිනමින් පැවැත්විය යුතු වන බව මැතිවරණ කොමිෂන් සභාවේ ස්ථාවරය වේ. ඒ සඳහා සුදුසු ඕනෑම ඡන්ද ක්‍රමයක් යටතේ එය පැවැත්වීම සඳහා සුදුසු නීතිමය සංශෝධනය කඩිනම් කර ඡන්ද විමසීම පැවැත්වීමට අවස්ථාව සලසන ලෙස මැතිවරණ කොමිෂන් සභාව ගරු කාරක සභාවේ අවධානයට ලක් කරමින් ඉල්ලා සිටී.

- **මැතිවරණ රාජකාරි කටයුතුවල යෙදෙන කාර්ය මණ්ඩල නාමකරණය සංශෝධනය කිරීම**

ඡන්ද විමසීම්වල දී ඡන්ද පොළ හා ඡන්ද ගණන් කිරීමේ කාර්යයවල යොදා ගනු ලබන නිලධාරීන්ගේ තනතුරු නාම වූ කණිෂ්ඨ ඡන්ද ස්ථානාධිපති/ ලිපිකරු යන තනතුරු නාම වෙනුවට ඡන්ද ස්ථානභාර නිලධාරී/ සහකාර ඡන්ද නිලධාරීන්/ ඡන්ද කටයුතු සේවා සහායක ආදී වශයෙන් හා ඡන්ද ගණන් කිරීමේ නිලධාරී වශයෙන් සංශෝධනය කිරීම.

- **මහජන නියෝජිතයයන්ගේ ධුර කාලය තුළ ආපසු කැඳවීම (Recall)**

යම් මැතිවරණක දී/ ඡන්ද විමසීමක දී ජනතාව විසින් තෝරාපත් කරගනු ලබන මහජන නියෝජිතයින් ජනතා අරමුණුවල ට පටහැනි හා නීති විරෝධී අයුරින් කටයුතු කරන්නෙ නම් එකී මහජන නියෝජිතයින් නැවත කැඳවීමේ ක්‍රමවේදයක් ඇති කිරීම සඳහා වූ නීති සම්පාදනය කිරීම.

- **පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර කාලය**

පාර්ලිමේන්තුවට තේරී පත් වූ යම් මන්ත්‍රීවරයකු ස්වකීය ධුර කාලයේ පළමු වර්ෂ 02 තුළ යම් රෝගී තත්ත්වයක් හෝ වෙන යම් සුවිශේෂී හේතුවකින් තොරව එම කාලය තුළ පවත්වන ලද පාර්ලිමේන්තු සභා රැස්වීම්වලින් අවම වශයෙන් 1/3 කටවත් සහභාගී නොවුවහොත් එම මන්ත්‍රීවරයාගේ ඉදිරි ධුර කාලය අහෝසි කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම.

- **ආචාර ධර්ම නීතිගත කිරීම**

මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ආචාර ධර්ම නීතිගත කිරීම හා ඒවා උල්ලංඝනය කරනු ලබන විට මැතිවරණ වරදක් ලෙස ඇතුළත් කොට මන්ත්‍රී ධූරය අහිමි වීමට ඉඩ සැලසෙන පරිදි නීතිමය විධාන ඇතුළත් කිරීම.



මැතිවරණ කොමිෂන් සභාවේ හිටපු සාමාජික ජීවන් ත්‍යාගරාජා මහතා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර ලෙස පත්ව යෑම නිමිත්තෙන් 2021.10.26 වන දින පැවති සුභ පැතීමේ උත්සවයේ විශේෂ අවස්ථා.



IFES Sri Lanka ආයතනය අනුග්‍රහයෙන් 2021.11.11 සහ 12 යන දිනවල කළුතර අවානි රෙසෝට් හි දී පැවැත් වූ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය පිළිබඳ මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීමේ දෙදින නේවාසික පුහුණු වැඩමුළුවේ විශේෂ අවස්ථා




IFES Sri Lanka ආයතනයේ අනුග්‍රහයෙන් 2021.11.02 සහ 03 යන දිනවල කළුතර අවානි රෙසෝට් හි දී පැවැත් වූ මැතිවරණ ක්‍රමවේද පිළිබඳ දෙදින නේවාසික පුහුණු වැඩමුළුවේ විශේෂ අවස්ථා




මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ මැතිවරණ කොමසාරිස් ජනරාල් ඇතුළු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් 2021.11.19 වන දින ත්‍රිකුණාමලය එඩින්බරෝ නිවාඩු නිකේතනය සංචාරක පරිහරණය සඳහා විවෘත කිරීමේ උත්සවයේ විශේෂ අවස්ථා




ඡන්දහිමි නාමලේඛනයේ තොරතුරු පරිගණක/ ජංගම දුරකථන මගින් ලබා ගැනීමේ නව ක්‍රමවේද පිළිබඳව හා එම කාර්යය දියත් කිරීමේ උත්සවය ඇතුළත් 2021.10.26 දින මැතිවරණ කොමිෂන් සභාවේ පැවති මාධ්‍ය හමුව.



IFES Sri Lanka ආයතනයේ අනුග්‍රහයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2021.10.27 සිට 29 දින දක්වා මහනුවර අමායා හිල්ස් රෙසෝර්ට්ස් හි දී පැවැත් වූ මැතිවරණ ක්‍රමවේද පිළිබඳ තෙදින නේවාසික පුහුණු වැඩමුළුවේ විශේෂ අවස්ථා.



IFES Sri Lanka ආයතනයේ අනුග්‍රහයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සඳහා දමිළ මාධ්‍යයෙන් 2021.11.08 හා 2021.11.09 යන දින වල දඹුල්ල අමායා ලේක් රිසෝට් හිදී පැවැත්වූ මැතිවරණ ක්‍රමවේද පිළිබඳ දෙදින නේවාසික පුහුණු වැඩමුළුවේ විශේෂ අවස්ථා



IFES Sri Lanka ආයතනයේ අනුග්‍රහයෙන් සියළුම මාණ්ඩලික නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2021.11.16 සහ 17 දිනවල මහනුවර ගෝල්ඩන් ක්‍රවුන් හෝටලයෙහි දී පැවැත්වූ මැතිවරණ ආරවුල් නිරාකරණය සහ සිව් අවුරුදු උපාය මාර්ග සැලැස්ම (2022-2025) සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ දෙදින නේවාසික වැඩමුළුවේ විශේෂ අවස්ථා.



මැතිවරණ කොමිෂන් සභාව පත්ව වසරක් ගතවීම නිමිත්තෙන් එම කාලය තුළ දී සඵල කරගත් ඉලක්ක හා අරමුණු පිළිඳව සකස් කරන ලද "වසරක පිය සටහන්" සමරු ග්‍රන්ථය හා "වසරක පිය සටහන්" කෙටි වීඩියෝ චිත්‍රපටය එළිදැක්වීමේ උත්සවයේ විශේෂ අවස්ථා


**උපදේශක මණ්ඩලය**

නීතිඥ නිමල් ජී. පුංචිහේවා - සභාපති
එස්. බී. දිවාරත්න - සමාජික
කේ.පී.පී. පතිරණ - සමාජික
එම්.එම් මොහොමඩ් - සමාජික
පී.එස්.එම්.චාල්ස් - සමාජික
සමන් ශ්‍රී රත්නායක - මැතිවරණ කොමසාරිස් ජනරාල්
එච්.එම්.ටී.ඩී. හේරත් - ලේකම්
රසික පීරිස් - අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)

**සංස්කාරක** - චන්න පී. ද සිල්වා (අධ්‍යක්ෂ, පර්යේෂණ හා ක්‍රමසම්පාදන)
**පරිගණක පිටු සැකසුම** - අමිල ගමගේ
**මුද්‍රණය** - රජයේ මුද්‍රණාලය
**ප්‍රකාශනය** - පර්යේෂණ හා සැලසුම් අංශය
මැතිවරණ කොමිෂන් සභාව



**ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න**

සංස්කාරක - කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.

(+94)0112868441-42-43
(+94)112868426
info@elections.gov.lk
www.elections.gov.lk
SriLankaElectionCommission
elecomsl
Election Commission of Sri Lanka
Election Commission of Sri Lanka



ISSN-2706-0047
9 772706 004002



මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ හෝ මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ හෝ අදහස් ප්‍රකාශ නොවේ.